2024.01.08

ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,

## කසල එකතු කිරීම හා ප්‍රවාහනය සඳහා නව ට්‍රැක්ටර් ට්‍රේලරයක් මිළ දී ගැනීම සඳහා පිරිවිතර

මේ සමග අමුණා ඇති 2024-01-08 දිනැති අංක Trailer/2024 දරණ නිර්මාණ ඇඳීමට (design) අනුව කසල එකතු කිරීම හා ප්‍රවාහනය සඳහා අවශ්‍ය නව ට්‍රැක්ටර් ට්‍රේලරයක් නිපදවා ගැනීම සුදුසු බවට පහත අත්සන් කරනු ලබන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.

ට්‍රේලර් සැපයුම්කරුවන් වෙත ලබා දිය යුතු උපදෙස්

1. තහඩු වල ඝනකම් හා ට්‍රේලරයේ ප්‍රමාණයන් එම නිර්මාණ ඇඳීමෙහි සඳහන් ප්‍රමාණයෙන්ම විය යුතුය. A3 ප්‍රමාණයේ කඩදාසියෙහි මුද්‍රිත නිර්මාණ ඇඳීමෙහි පිටපතක් මෙම උපදෙස් සමග ලබා දෙනු ඇත.
2. ඉදිරිපත් කරන මිළ ගණන් දින 90ක කාලයක් සඳහා වලංගු විය යුතුය.
3. මෙට්‍රික් ටොන් 3 ක ධාරිතාවයකින් යුත් හයිඩ්‍රොලික් ටිපිං සිලින්ඩර් සවි කළ යුතුය.
4. ට්‍රේලරය සඳහා වසර දෙකක වගකීම් කාලයක් ලබා දිය යුතුය. ටයරයේ සිදුවන සාමාන්‍ය ගෙවීම සහ අනතුරකින් සිදුවන හානි හැර අනෙකුත් සියළු නිෂ්පාදන දෝෂ, පැස්සීම්, හෝස්, හයිඩ්‍රොලික් ජැක්, බෙයාරිං සහ තහඩු කැඩී යාම සම්බන්ධයෙන් මෙම වගකීමෙන් ආවරණය විය යුතුය. වගකීමට සම්බන්ධ අළුත්වැඩියාවන් ට්‍රේලරය ඇති ස්ථානයට පැමිණ සිදුකළ යුතුය. ඒ සඳහා ප්‍රවාහන ගාස්තු ගෙවනු නොලැබේ.
5. සපයන ට්‍රේලරය සමග එහි සම්පූර්ණ වගකීම් කාලයට හා ඉන් ඔබ්බට දින 28කට වලංගු වන ලෙස එම වගකීම සඳහා ඇපයක් වශයෙන් ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබා ගත් බැංකු ඇපකරයක් ලබා දිය යුතුය. එය මුළු ප්‍රසම්පාදන වටිනාකමින් 5% වටිනාකමක් විය යුතුය.
6. නිපදවන ට්‍රේලර් පළාත් පාලන ආයතනය වෙත ප්‍රවාහනය නොමිලේ සිදුකර භාර දිය යුතුය.
7. ට්‍රේලරයේ චැසි අංකයක් තිබිය යුතු අතර, සැපයුම්කරු විසින් අමතර අය කිරීමකින් තොරව ට්‍රේලරය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කර, ලියාපදිංචි කිරීමේ සහතිකය (Certificate of Registration) හා අංක තහඩු පළාත් පාලන ආයතනය වෙත ලබා දිය යුතුය.
8. සපයා ඇති නිර්මාණ ඇඳීමට (technical drawing) අනුව ට්‍රේලර් නිපදවිය විය යුතු අතර නිෂ්පාදනයේ දී ඇතිවන තාක්ෂණික ගැටළු දුරකථන අංක 075-6310846 මගින් යාන්ත්‍රික ඉංජිනේරු අමතා නිරාකරණය කර ගත යුතුය.
9. මිළ ගණන් වලට අදාළව රජයට ගෙවන වැට් බදු වෙතොත් ඒවා මිළ ගණන් විස්තරයේ වෙන්කර දැක්විය යුතුය.
10. ඇණවුම නිකුත් කළ දින සිට සති තුනක (දින 21ක) කාලයක් තුළ ට්‍රේලරය නිපදවා භාර දිය යුතුය. සැපයීම සඳහා දින 21කට වඩා කාලයක් අවශ්‍ය නම්, එම අවශ්‍ය කාලසීමාව මිළ ගණන් සමග සඳහන් කළ යුතුය.

තාක්ෂණික ඇගයීම් කමිටුව

| | | |
|---|---|---|
| එම්.ආර්.එම්. රිස්වි | දුමින්ද කරුණාරත්න | එන්.ඩී. රණවීර |
| යාන්ත්‍රික ඉංජිනේරු | තාක්ෂණ සේවා නිලධාරී | තාක්ෂණ සේවා නිලධාරී |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | අකුරැස්ස ප්‍රාදේශීය සභාව | අකුරැස්ස ප්‍රාදේශීය සභාව |
| දකුණු පළාත. | | |

එම්. ආර්. එම්. රිස්වි
යාන්ත්‍රික ඉංජිනේරු
පළාත් පාලන දෙපාර්තමේන්තුව.
දකුණු පළාත.